**විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන උළෙල 2022**
**විශිෂ්ටතම ශාස්ත්‍රීය ග්‍රන්ථය- පූර්විකාව**

දෙදහස් විසිදෙක විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන උළෙලේ දී අභිනවයෙන් පිරිනමනු ලබන මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා විෂය ධාරවන්හි වසරේ විශිෂ්ටතම ශාස්ත්‍රීය ග්‍රන්ථය සඳහා පිරිනැමෙන විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මානයට අදාළ පූර්විකාව සභාගත කිරීමට ගරු ස්වාමීන්වහන්සේලාගෙන්, සියලු ආරාධිතයින්ගෙන් හා සහෘද ඔබ සියලු දෙනාගෙන් අවසරයි.

කිසියම් ශාස්ත්‍රඥයකු විසින් තමා ශාස්ත්‍රඥ පරිචය ලැබූ විෂය ක්ෂේත්‍රයක නව ඥාන සම්පාදනය අරබයා තම කාර්යයට උචිත විද්‍යාත්මක ක්‍රමවේද භාවිත කරමින් ද, ශාස්ත්‍රීය ලේඛනයකට උචිත විධිමත් භාෂා ශෛලියක් හා තම විෂය පථයට අදාළ තාක්ෂණික වාග් මාලාවක් භාවිත කරමින් ද, තමා විසින් භාවිත කරන ලද ප්‍රාථමික හා ද්වීතියික මූලාශ්‍රයන් නිසි පරිදි ගෙනහැර දක්වමින් ද සම්පාදිත කෘතියක් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ලෙස සැලකේ. එවන් ශාස්ත්‍රීය ග්‍රන්ථ ඇගයීමේ දී ලෝකයේ සුලභව භාවිත කරනු ලබන පහත සඳහන් නිර්ණායක මෙවර විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන උළෙලෙහි වසරේ විශිෂ්ටතම ශාස්ත්‍රීය ග්‍රන්ථය ඇගයීමේදී ද යොදා ගැනිණි.

ඒවා සංක්ෂිප්තව මෙසේය,

1. අදාළ විෂය ක්ෂේත්‍රයේ නව ඥාන සම්පාදනය සඳහා කෘතිය මගින් දක්වනු ලබන දායකත්වය. (Originality or uniqueness of treatment)

2. තම කාර්යයට උචිත පර්යේෂණ ක්‍රමවේද භාවිතකොට තිබීම. (The quality and the rigor of the methodological approach)

3. ශාස්ත්‍රීය ලේඛනයකට උචිත භාෂා ශෛලියක් හා තම විෂය ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික වාග් මාලාවක් භාවිතකොට තිබීම. (The use of the academic language and academic jargon)

4. භාවිත කරන ලද ප්‍රාථමික හා ද්වීතීයික මූලාශ්‍රයන් නිසි පරිදි ඉදිරිපත් කොට තිබීම. (In-text citations and Referencing)

5. සමස්ත ග්‍රන්ථයෙහි සැකැස්ම හා එහි නිමාව. (Overall presentation of the book)

මෙවර විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන උළෙලෙහි වසරේ විශිෂ්ටතම ශාස්ත්‍රීය සම්මානය සඳහා ඉදිරිපත්කර තිබූ සමස්ත ග්‍රන්ථ ප්‍රමාණය 78 කි. ඒවා විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන විද්වත් මණ්ඩලයක් මගින් වට 3ක් ඔස්සේ ඇගයීමට ලක් කරන ලදි. ඒ අතරින් අවසන් වටය සදහා තෝරා ගැණුනු ශාස්ත්‍රීය ග්‍රන්ථ 05 අකාරාදී පිළිවෙලින් මෙසේය.

1. ගොඩගේ ප්‍රකාශකයින් විසින් ප්‍රකාශිත, මහින්ද කේ. විමලසිරි ලේඛකයා විසින් රචිත ''කඩවර ඇදහීම".

2. ගොඩගේ ප්‍රකාශකයින් විසින් ප්‍රකාශිත, මහින්ද සෝමතිලක ලේඛකයා විසින් රචිත ''කෙවුල්ගම දළදා ගමන් මාළිගය".

3. ගොඩගේ ප්‍රකාශකයින් විසින් ප්‍රකාශිත, ප්‍රේමසිරි නාගසිංහ ලේඛකයා විසින් සංස්කරණය කරන ලද ''සිංහල උපාසක ජනාලංකාරය".

4. Wapa University Press මගින් ප්‍රකාශිත සමන් පනාපිටිය ලේඛකයා විසින් රචිත ''සිංහල ජන ගායනා ශෛලී''.

5. සරසවි ප්‍රකාශකයින් විසින් ප්‍රකාශිත සන්ධ්‍යා කහඳගමගේ ලේඛිකාව විසින් රචිත ''සංඛ්‍යා පුරාණය''.

මීළඟට මෙම නිර්දේශිත ග්‍රන්ථ 05 සංක්ෂිප්තව හඳුන්වාදීම සිදුවේ.

මෙහි දී අපගේ මුල් ම අවධානය යොමු වන්නේ මහින්ද කේ. විමලසිරි ලේඛකයා විසින් රචිත "කඩවර ඇදහීම" නම් කෘතියට යි. මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ කඩවර ඇදහීම හා යාතුකර්ම පිළිබඳව කරන ලද විමර්ශනාත්මක අධ්‍යනයක ප්‍රතිඵලයකි. ග්‍රන්ථය හඳුන්වාදෙමින් කතුවරයා ප්‍රකාශ කරන පරිදි මෙම කෘතියේ මුඛ්‍ය අරමුණ වන්නේ ලංකාවේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්තව ඇති කඩවර සංකල්පය පිළිබඳව විධිමත් ගවේශනයක් සිදු කිරීමයි. එහි දී උඩරට, පහතරට, සබරගමු, ඌව සහ නුවර කලාවිය ප්‍රදේශවල සිදුකෙරෙන කඩවර ශාන්ති කර්මයට අදාළ සම්ප්‍රදායන් චාරිත්‍ර, වාරිත්‍ර හා විවිධ අභිචාර විධි පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් සිදුකර ඇත. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් මනාව පරිශීලනය කරමින් ගුණාත්මක පර්යේෂණයේ දී සුලභව භාවිත කරනු ලබන සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය යන ක්‍රමවේදයන් භාවිතයෙන් සිදු කරන ලද මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය ලංකාවේ කඩවර සංකල්පය ප්‍රාදේශීය අනන්‍යතා සහිතව විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති ආකාරය ගැඹුරින් විමර්ශනය කිරීමට දරණ ලද උත්සාහයකි.

අපගේ අවධානය යොමුවන දෙවන ග්‍රන්ථය වන්නේ මහින්ද සෝමතිලක ලේඛකයා විසින් රචිත ''කෙවුල්ගම දළදා ගමන් මාළිගය" නම් කෘතිය යි. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ සමයෙහි ලංදේසීන් විසින් උඩරට ආක්‍රමණය කිරීමත් සමඟ ආරක්ෂාව උදෙසා දළදා වහන්සේ මහනුවර සිට රැගෙන ගොස් වසර තුනක කාලයක් මැද මහනුවර ප්‍රදේශයේ පිහිටි ස්ථාන කීපයක තැන්පත්කොට තිබූ අකාරය විග්‍රහ කිරීමත් ඒ අතරින් එම වසර තුන තුළ දීර්ඝතම කාලයක් දළදා වහන්සේ වැඩසිටි කෙවුල්ගම ගල්ලෙන් විහාරය පිළිබඳව ඓතිහාසික විවරණයක් සිදු කිරීමත් මෙම ග්‍රන්ථයේ අරමුණු වේ. මෙතෙක් ඉතිහාසඥයන්ගේ වැඩි අවධානයක් යොමුව නැති ඓතිහාසික ස්ථානයක් පිළිබඳව බඹරගල තුඩපත, කෙවුල්ගම තල්පත හා කෙවුල්ගම තුඩපත වැනි දුර්ලභ ඓතිහාසික මූලාශ්‍ර භාවිත කරමින් සිදුකරන ලද ශාස්ත්‍රීය ගවේශණයක් ලෙස කෙවුල්ගම දළදා ගමන් මාළිගය හැඳින්විය හැකිය. දළදා ගමන් මාර්ගය පිළිබඳව ඉතිහාසඥයන් අතර පවතින ඇතැම් මත අභියෝගයට ලක්කරමින් කිරීමට ද මෙම ග්‍රන්ථයෙහි කතුවරයා සමත් වී තිබේ. උදාහරණයක් ලෙස දළදා වහන්සේ මැද මහනුවර ප්‍රදේශයේ වැඩසිටි කාලය මාස 9ක් හෝ වසරක් පමණ වෙතැයි ඇතැම් ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් වෙතත් එය අවුරුදු 3ක් තරම් දීර්ඝ කාලයක් වන බව කතුවරයා මෙහි දී ඓතිහාසික සාක්ෂි මත පිහිටා නිගමනය කරයි.

අපගේ අවධානය යොමුවන මීළඟ ග්‍රන්ථය වන්නේ ප්‍රේමසිරි නාගසිංහ ලේඛකයා විසින් සංස්කරණය කරන ලද "සිංහල උපාසක ජනාලංකාරය"නම් කෘතිය යි. කතුවරයා විසින් ම හඳුන්වාදෙන පරිදි මෙය මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් විසින් මහනුවර යුගයේ දී පාලි භාෂාවෙන් සිංහලට පරිවර්තනය කරන ලද "උපාසක ජනාලංකාරය" නම් කෘතියේ සංස්කරණයකි. සංස්කරණයට අමතරව පාඨක

ප්‍රයෝජනය සඳහා ඊට සවිස්තරාත්මක විවරණයක් ද එක්කොට තිබීම මෙම ග්‍රන්ථයේ විශේෂත්වයකි. පෞරාණික ග්‍රන්ථ සංස්කරණයේ දී භාවිත කරනු ලබන සම්මත විධික්‍රම මනාලෙස භාවිත කරමින් සිදුකර ඇති මෙම සංස්කරණය සඳහා ලංකාවේ විවිධ වෙහෙර විහාරවලින් ලබාගන්නා ලද පුස්කොළ පිටපත් 08ක් සහ මුද්‍රිත පිටපත් 04ක් භාවිතකොට තිබීමෙන් සිංහල උපාසක ජනාලංකාරයෙහි වඩා නිවැරදි නව සංස්කරණයක් ජනගත කිරීමට කතුවරයා දරාඇති උත්සාහය පැහැදිලිය.

සමන් පනාපිටිය ලේඛකයා විසින් රචිත "සිංහල ජන ගායන ශෛලී"නම් කෘතිය අපගේ අවධානයට යොමුවන මීළඟ ශාස්ත්‍රීය ග්‍රන්ථය යි. දශක ගණනාවක් තිස්සේ සිංහල ජනකවිය දෙස් විදෙස් බොහෝ විද්වතුන්ගේ, පර්යේෂකයන්ගේ අවධානයට ලක්ව ඇති නමුත් ජනකවි වර්ගීකරණයේ දී ඒ සඳහා බහුලව ම භාවිත කොට ඇත්තේ සාහිත්‍යාත්මක ප්‍රවේශයකි. එවැනි සාහිත්‍යාත්මක වර්ග කිරීමක දී ජන කවියෙන් ප්‍රකට වන අර්ථය, එය ගායනා කරනු ලබන අවස්ථාව හා එහි ඇතුළත් භාෂාව වැනි කරුණු අවධානයට යොමු වේ. සාහිත්‍යාත්මක ප්‍රවේශයක් මත පමණක් පිහිටා ජන කවි වර්ග කිරීම හේතුවෙන් මතුවන ගැටළු රාශියක් කතුවරයා මෙහි දී පෙන්වා දී ඇත. මෙවන් පසුබිමක මෙම ග්‍රන්ථයෙහි මූලික අරමුණ වන්නේ බහුලව භාවිතකොට ඇති සාහිත්‍යාත්මක ජන ගී වර්ගීකරණය වෙනුවට නාද යෙදුම් හා නාද ශ්‍රේණි පිළිබඳ සිදුකරන විවරණයක් මත පිහිටා ජන ගී වර්ගීකරණය සිදුකළ හැකි ආකාරය පෙන්වා දීමයි. මානව වංශ පර්යේෂණ ක්‍රමවේදය (ethnography), ප්‍රත්‍යේක අධ්‍යනය (case study), පදනම් වූ සිද්ධාන්ත සංකල්පය (grounded theory) වැනි ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද භාවිත කරමින් සිදුකරන ලද මෙම අධ්‍යයනය මගින් කතුවරයා තමා භාවිත කරන ලද සංගීතාත්මක ප්‍රවේශය මත පිහිටා සිංහල ජන ගායන ශෛලීන් එකොළහක් හඳුනාගෙන ඇති අතර ඒ සදහා භාවිතකොට ඇති තාක්ෂණික ක්‍රමවේදය විස්තරාත්මකව මෙම ග්‍රන්ථයේ ඉදිරිපත්කොට තිබේ.

මෙහි දී අපගේ අවධානය යොමුවන අවසන් ශාස්ත්‍රීය ග්‍රන්ථය වන්නේ සන්ධ්‍යා කහඳගමගේ ලේඛිකාව විසින් රචිත "සංඛ්‍යා පුරාණය" නම් කෘතිය යි. මෙහි මුඛ්‍ය අරමුණ වන්නේ සිංහල ජන සමාජයේ විවිධ අවස්ථාවල දී ව්‍යවහාර වන සංඛ්‍යාවේදය ජනශ්‍රැති විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ අධ්‍යයනය කිරීම යි. එහි දී පුරාවෘත්ත, පුරාණෝක්ති, ජනකතා ආදී ජන ආඛ්‍යාන මෙන් ම ජන කවි, ප්‍රස්ථාව පිරුළු, තේරවිලි වැනි මාධ්‍ය ද අධ්‍යයනය සඳහා පාදක කොට ගෙන ඇත. උපතේ සිට මරණය දක්වා පුද්ගලයකු මුහුණ දෙන විවිධ සංසිද්ධීන්වල දී සංඛ්‍යාත්මක ඥානය භාවිතවන ආකාරය ක්ෂේත්‍ර පර්යේෂණයක් තුළින් තමා රැස් කරන ලද ප්‍රාථමික දත්ත මෙන් ම විවිධ මූලාශ්‍රයන්ගෙන් ලබාගත් ද්විතීයික දත්ත නිදර්ශන සහිතව ගෙනහැර දැක්වමින් මෙම ග්‍රන්ථයෙහි දීර්ඝව විස්තර කොට තිබේ. ඉන් නොනවතින කතුවරිය සංඛ්‍යා ව්‍යවහාරය තුළින් හෙළිවන ශ්‍රී ලාංකීය සමාජ, සංස්කෘතික චින්තනය විවිධ පැතිකඩ ඔස්සේ විවරණය කරයි. මෙම අධ්‍යයනයේ දී ප්‍රශ්න මාලා ක්‍රමය, කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සහභාගීත්ව නිරීක්ෂණය යන ක්‍රමවේදයන් භාවිත කරමින් ලංකාවේ දිස්ත්‍රික්ක 10 කට වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි රැස් කළ දත්ත මගින් සංඛ්‍යා භාවිතයේ ප්‍රාදේශීය අනන්‍යතා ලක්ෂණ මතුකොට දැක්වීමට ද කතුවරිය සමත් වී ඇත.

මෙවර විද්‍යෝදය ශාස්ත්‍රීය සම්මානය සඳහා නිර්දේශිත ඉහත ග්‍රන්ථ 05 අතරින් වසරේ විශිෂ්ටතම ශාස්ත්‍රීය ග්‍රන්ථය තෝරා ගැනීම අතිශය දුෂ්කර කටයුත්තක් වූ බව අප මෙහි දී සඳහන් කළ යුතුය. ඊට හේතුව වන්නේ එකිනෙකට වෙනස් වූ මෙම කෘතීන් අදාළ විෂය ක්ෂේත්‍රයන්හි ඥාන සම්පාදනය සඳහා දක්වනු ලබන දායකත්වය ඉමහත් හෙයිනි. කෙසේ නමුත් ඉහත ග්‍රන්ථ ඇගයීමේ දී ඇගයීම් මණ්ඩලය විසින් නිර්ණායක ලෙස භාවිත කරන ලද නව ඥාන සම්පාදනය සඳහා අදාළ කෘතිය දක්වනු ලබන දායකත්වය, තම කාර්යයට උචිත ශාස්ත්‍රීය විද්‍යාත්මක ක්‍රමවේද භාවිත කර ඇති ආකාරය, ශාස්ත්‍රීය ලේඛනයකට උචිත භාෂා භාවිතය, ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් නිසිපරිදි ගෙනහැර දක්වා තිබීම, ග්‍රන්ථයේ සැකැස්ම හා ආකර්ෂණීය නිමාව යන කරුණු සියුම්ව සලකා බැලීමේ දී ඇගයීම් මණ්ඩලයේ වැඩි ම අවධානය දිනාගැනීමට සමත්වීම හේතුවෙන් 2022 විද්‍යෝදය සාහිත්‍ය සම්මාන උළෙලේ වසරේ විශිෂ්ටතම ශාස්ත්‍රීය ග්‍රන්ථය උදෙසා පිරිනමනු ලබන විද්‍යෝදය සම්මානය හිමි කරගන්නේ "සිංහල ජන ගායන ශෛලී" නම් කෘතිය යි.

ආචාර්ය සුජීව හෙට්ටි ආරච්චි
අධ්‍යක්ෂක, අන්තර්ජාතික බහු විෂයීය පර්යේෂණ මධ්‍යස්ථානය
අංශ ප්‍රධාන, ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යනාංශය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය